# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
# පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායනයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

***1. අත්හදාබැලීමේ නිලධාරී (MA - 4)- තනතුරු 06***

- **සුදුසුකම් :**

➢ **බාහිර** (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/කෘෂිකර්මය/වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රජයේ සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබීම.

4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   අදාළ ක්ෂේත්‍රයේ රජයේ සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබීම.

➢ **අභ්‍යන්තර** (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික කාණ්ඩයේ (MA 2-2) කාර්මික නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස** : අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

- **සේවා කාණ්ඩය** : ක්‍රියාත්මක කිරීමේ/උපදේශක (MA – 4)

- **වැටුප් පරිමාණ** : රු.64,320 – 10 x 1,360 – 15 x 1,670 – 5 x 2,040 – 113,170

- **රැකියා විස්තරය** : පර්යේෂණ නිලධාරී / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී/ ප්‍රධාන පර්යේෂණ නිලධාරී අධීක්ෂණය යටතේ විශේෂිත විෂය පථයන්හි පර්යේෂණ කටයුතු, අත්හදාබැලීමේ කටයුතු සහ සමීක්ෂණ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල සහ සමීක්ෂණ වාර්තා ආදිය පවත්වාගෙන යාම සහ පුහුණු හා දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වීම, රසායනික ද්‍රව්‍ය, උපකරණ ආදිය මිලදී ගැනීමේ (ප්‍රසම්පාදන) කටයුතුවලදී තාක්ෂණික සහාය ලබා දීම අත්හදා බැලීමේ නිලධාරියෙකුගේ වගකීම වේ. තවද සංඛ්‍යානමය දත්ත, කාලගුණ විද්‍යාත්මක වාර්තා, තම අංශයේ භාණ්ඩ ලේඛණය මෙන්ම භාණ්ඩ ලැබීම් සහ නිකුත් කිරීම් පොත් පවත්වාගෙන යාම සහ රසායනාගාර කටයුතු හා අනෙකුත් සේවකයින් අධීක්ෂණය කිරීම ද මෙයට ඇතුළත් වේ.

- **සුදුසුකම් :**

- **බාහිර**

  තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

➢ **අභ්‍යන්තර**

  ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

- **වයස** : අවුරුදු 18 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

- **සේවා කාණ්ඩය** : කළමනාකරණ සහකාර තාක්ෂණ (MA 2-2)

- **වැටුප් පරිමාණ** : රු.50,540– 10 x 540 – 7 x 630 – 4 x 1,080– 20 x 1,280 - 90,270

- **රැකියා විස්තරය** : වතුයායේ සියලුම ක්ෂේත්‍ර කටයුතු සහ කළමනාකරණ කටයුතුවලදී ජොෂ්ඨ කළමනාකරු/ කළමනාකරු (වතු) සහාය වීම ක්ෂේත්‍ර නිලධාරියෙකුගේ වගකීම වේ. නියමිත වැඩ සඳහා සේවකයින් අනුයුක්ත කිරීම, චෙක්රෝල් සහ පෙරෙට්ටු වැඩ කටයුතු, සියලුම කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම, පිරිවැය පාලනය කිරීමේ සහ ඵලදායිතාව ඉහළ නැංවීමේ පියවර හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම, පැමිණීමේ ලේඛනය, ක්ෂේත්‍ර දිනපොත සහ ප්‍රගති පොත ආදිය පවත්වාගෙන යාම මෙයට ඇතුළත් වේ. මීට අමතරව, අංශයේ තොග ලේඛන නඩත්තු කිරීම, කම්කරු ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පාර්ශවකරුවන්ගේ පුහුණු කටයුතු සඳහා සහාය වීම ද ක්ෂේත්‍ර නිලධාරියාගේ වගකීමකි.

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**අයදුම්පත් ක්‍රියාවලිය**

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියළුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමඟ අයදුම්කරුවන් විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2026.07.24 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය, තෙලවල පාර, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාදවී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකි ය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

සභාපති<br>
රබර් පර්යේෂණ මණ්ඩලය<br>
තෙලවල පාර<br>
රත්මලාන.

2026.07.06